# සත්ත්ව ලෝකයේ පුදුමාකාර ගෘහ නිර්මාණ ක්‍රම

කුරුල්ලන්ට පුදුම උපදවන ගෘහනිර්මාණ ශිල්පයක් සොබාදහම දයාද කර ඇත. අප රටේ දක්නට ලැබෙන වඩු කුරුල්ලා උගේ ශ්‍රමයෙන් තනා ගසෙහි එල්ලෙන ඇතුළතට යා හැකි කදිම දෙරටුවකින් සමන්විත පේටිකාවක් ද ඇති කූඩුවක් තනා ගනී.

## මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර


නූතන ගෘහනිර්මාණ ශිල්පීන් ගෙවල් සෑදීම සඳහා ඉතාමත් අඩු වියදමින් සැප පහසුව ඇතිව ගෘහ නිර්මාණ කිරීමට උත්සාහ ගනී. සත්ත්ව ලෝකයේ ගෘහනිර්මාණ ශිල්පය ගැන බලන අපට මේ පිළිබඳ වැදගත් අදහස් රැසක් දැක ගත හැක. ජීවත්වන ගෙය සත්ත්ව ලෝකය තුළ වසර දහස් ගණනක සිට පැවත එන දෙයක්. නමුත් මෙය මිනිසාට අලුත් අලුත් අදහස් ගෙනදිය හැක. සමූහ ගෙවල් ක්‍රමය ද සතුන් අතර ඇත. ඒ අයුරින්ම කොටස් වෙන් කර තනන ලද අද මිනිසුන් පවා කැමති ක්‍රම එද මානවයන් යොදා ගෙන ඇත. එද මධ්‍යධරනී මුහුද අසල 'නයිස්' වරායට කිට්ටු 'ටෙරා අමාටා' පෙදෙසක පීකිං මිනිසාගේ කාලයට වසර 400,000 පෙර විසූ හෝමෝ ඉරෙක්ටස් ඍජු මිනිසා ගල්ගුහාවල පමණක් නොව ටෙරා අමාටා වල ගස් අතු කැබලි ගෙන තනා ගත් ගෙවල් ජර්මන් විද්‍යාඥ ෆ්‍රැන්ක් විඩෙන් රිච් (1935 සිට 1937 දක්වා) කරන ලද කැනීම් වලින් සොයාගෙන ඇත. ගල්ගුහා වලින් පසු සත්ත්ව ලෝකයේ සතුනගේ ගෘහනිර්මාණ ශිල්පයට සමාන මෙම නිවහන් ගස් කැබලි වලින් කෝටු වලින් තනා ගෙන ඇත. ආදි මානවයාගේ සිට නූතන මානවයා තෙක් ගෘහනිර්මාණ ශිල්පයට අදහස් රැසක් සතුනගේ චර්යාවෙන් ලබා ගන්නට ඇත.

කුරුල්ලන්ගේ හැකියාව ප්‍රමුඛ තැනක් ගනී. මොවුන්ට පුදුම උපදවන ගෘහනිර්මාණ ශිල්පයක් සොබාදහම විසින් දයාද කර ඇත. අප රටේ දක්නට ලැබෙන වඩු කුරුල්ලා උගේ ශ්‍රමයෙන් තනා ගසෙහි එල්ලෙන ඇතුළතට යා හැකි කදිම දෙරටුවකින් සමන්විත පේටිකාවක් ද ඇති කූඩුවක් තනා ගනී. මෙවැනි කූඩු රාශියක් ම හැම කුරුල්ලෙක් ම වාගේ සුපුරුදු ගසක එල්ලා ගනී. දින කිපයකදී මෙය තනා නිමකරයි. ඉතාමත් චමත්කාර ගෘහනිර්මාණ ශිල්පයක් දක්නට ඇත්තේ ඕස්ට්‍රේලියාවේ හා නිව්ගිනියාවේ ජීවත්වන බිවර් කුරුල්ලන්ගේ ය. (Bewer birds) මෙම සතුනගේ ලැගුම් සඳහා නිවහන නිර්මාණය වුවත් එක් කොටසක් වෙන්වී ඇත්තේ පෙම්කෙලිය සඳහා ය. තව එකක් සීමාවත්තේ සංසර්ගය සඳහා ය. මෙහිදී පිරිමි සතා නිවහන සෑදීමේ කාර්යය ඉටු කරයි. එය තමාගේ ක්‍රියාවලි හා සහකාර කිරිල්ලියගේ ආශාව ඉටුවන අයුරින් සිදු කරයි. බිවරයන් උස ය. කූඩුව තනාගන්නේ පැහැදිලි ගස් කඳක් අසල ය.

කූඩුවේ බිත්ති ගස් වැල් එකට ඔතාගෙන සාදයි. පළමුව මෙහි මූලික සැලැස්ම අවසන් වූ පසු දිග ගස්වැල් යොදා වහල සාදයි. ඇතුළත තණබිසි බඳු පෙඳ ගස් සහ පර්නාංග යොදා ගෘහය අලංකාර කිරීමේ දක්ෂයන් ය.

සමහර විශේෂ ඕකිඩ් මල් කැබලි ගෙන සරසති. එහි ඇතුල්වීමට දෙරටුව යොදා එය පෙඳ වැනි දෙයකින් සරසයි. සමහරවිට කුඩා පලතුරු බෙරි යනාදිය ද මෙහි තබයි.

73 පිටුවට





කුරුලු නිවහනක්

# සත්ත්ව ලෝකයේ ...

61 පිටුවෙන්

ඉනාමත් නිර්මාණාත්මක ගෙයක් තනා ගනී. අප සෑම කූඩුවක් දෙසම බැලුවහොත් එය ආරක්ෂිත ස්වභාවික පරිසරයට හානි නොවන ලෙස නිමැවීම විශේෂ ලක්ෂණයකි. කිරිල්ලියට දෙන සැප පහසුව හා පැටවුන්ට ලැබෙන ආරක්ෂාව වැදගත්ය. එක් එක් වර්ගයේ කුරුල්ලන්ට ආවේණික ගෘහ නිර්මාණ ශිල්පී ක්‍රම ඇත.

කුරුල්ලන් මෙන්ම හිම වලසා ද ගෘහනිර්මාණ ශිල්පය උපයෝගි කර ගනී. නිවහන තැනීම සිදුවන්නේ ගැහැනු සතාගෙනි. වියළි ස්වභාවයෙන් වැලකීම පළමු තැන ගනී.

පළමුව ඇය හිමවලින් විශාල රවුම් දෙකක් සාදයි. මෙය බිහි කිරීමට යන තම පැටියාගේ ආරක්ෂාව සඳහා ය. මෙහි ඇතුල් වන පෙදෙස තනා ගනී.

පසුව මෙහි ජීවත් වීමට කාමරයක් සහ නිදන කාමරයක් සාද ගනී. මෙයට වැඩි බිත්තියක් වැනි පෙදෙසක් තනා අර්ධ කවාකාර පැලැල්ලක් ලෙස තබයි. හැම දෙයක්ම සිදු කිරීමට වන්නේ වියළි ස්වභාවය නැති කිරීමට ය.

මීයන්ගේ ද ගෘහනිර්මාණ ශිල්පයක් ඇත. හික්මීයා (Mole rat)උගේ නිවහන තුළ ගුහාව තුළ වැසිකිලි ක්‍රමයක් ද තනයි. මෙය තම බිරිඳටත් පැටවාටත් වෙන් වශයෙනි.

ඒවා අපිරිසිදු වන විට වසා දැමීම ද සිදු කරයි. පසුව තවෙකක් වෙන ම ගුලක් හාරා තනයි. වැසිකිලි තැනීමේදී ආහාර රැස් කරන තැන්වලට දුරින් ඒවා තැනීමට වගබලා ගනියි. තවත් මීයන් කොටසක් නම් වෙල් මීයන් (Harvest mouse)ය. මෙම සතුන් සිතා ඇති දෙයක් නම් ගෘහයේ දෙරවල් හා ජනෙල් අවශ්‍ය බව ය. මේ නිසා තම ගුලට ඇතුලු වන විටත් පිට වන විටත් කොල කැබලි යොද ඒවා තනා ගනී. එහා මෙහා ගමන් කරන විට මේවා වැසීම හා විවෘත වීම සිදුවේ. මෙම කූඩුව ක්‍රිකට් බෝලයක් තරම් විශාල ය. මෙය පුදුම උපදවන ශිල්පී ක්‍රමයකි. මේවා ගස්වල නටුවලින් වියා සාද ඇත. මෙය සාද ගැනීම සඳහා විශේෂ තිශ්වල පරිසරයක් අවශ්‍ය ය. මෙය විවීමේදී ධාන්‍ය ගස් නටු ගෙන ඒවා ගසෙහි තිබියදීම පලා සිහින්කර සාද ගත් අයුරු දක්නට ලැබේ. මෙම නටු ගසෙහි තිබියදී ම සකසා ගන්නා අයුරුත් පසුව නිවහනට ගෙන එන අයුරුත් නිරීක්ෂණය කර ඇත.

කෘමීන්ගේ ලෝකය දෙස බලමු. මී මැස්සා උගේ වදය තැනීමත් එහි කුටි සකස් කිරීමත් පුදුම උපදවන්නකි. රජිනට තැන්පත් වී සිටීමටත් වැඩකාර මැස්සන් ආරක්ෂක මැස්සන් ආහාර ගෙන එන මැස්සන්ට වෙන් වෙන් අයුරු කුටි තනා ඇත. මෙය සිදු කරන විට කිසිදු ජ්‍යාමිතික උපකරණ හෝ උපදෙස් ලබා නැත. එහෙත් හැම කුටියක ම දිග පළල සමාන ය. සොබාදහම මෙම සතුනට ලබාදී ඇති විශේෂ ක්‍රියා කලාපය එය විදහා පායි. මේ අයුරු සැලකිය හැකි තවත් දෙයකි, වේයාගේ තුඹස. මෙහි ද වේයාගේ තරාතිරම අනුව වෙන වෙනම තැන් තනා ඇත. කිසිදු අඩුපාඩුවක් නොමැතිව තනා ගනී.

කෘමි ලෝකයේ අප දන්නා තවත් සතෙකි කුඹලා. කුඹලා උගේ ගෙය සාද ගැනීමට තෝරා ගන්නා තැන වැසි සුළං නැති තැනකි. ප්‍රමාණය ද තැනට සුදුසු අයුරින් තෝරා ගනී. පැටවුන් ජීවත්වීමටත් ආහාර බැහැරලීමටත් තැන් වෙන් කර ඇත. ඇතුළතට පැමිණෙන දෙරටුව පසුව විවෘත කර ගැනීමේ හැකියාවකට සුදුසු ලෙස තනයි. කෘමි ලෝකයේ මෙවන් නිදසුන් රැසකි.

මෙහි දැක්වූ සියලු දෙයක් ම පුදුමාකාර ගෘහනිර්මාණ ශිල්පී ක්‍රම වේ. අප ගෘහනිර්මාණ ශිල්පීන්ට අදහස් රැසක් ලබා ගත හැකි ය. සත්ත්ව ලෝකයේ ගෘහනිර්මාණ ශිල්පය අදට වඩා වසර ගණනක් ඉදිරියෙන් ඇති බව නොරහසකි. ❑